Sinhalese | සිංහල

1.0 වැනි අනුවාදය

2023 පෙබරවාරි

# වික්ටෝරියාවේ ළමා සුරක්ෂිතතා ප්‍රමිතීන්

## සරල භාෂා මාර්ගෝපදේශය

COMMISSION FOR CHILDREN AND YOUNG PEOPLE

# ළමා සුරක්ෂිතතා ප්‍රමිතීන් යනු මොනවා ද?

- ළමා සුරක්ෂිතතා ප්‍රමිතීන් (ප්‍රමිතීන්) 2016 ජනවාරි මාසයේ වික්ටෝරියාවේ දී ආරම්භ විය.
- මෙම ප්‍රමිතීන් දරුවන් අපයෝජන හා හානිවලින් ආරක්ෂා කර ගැනීමට උපකාරී වේ.
- ළමා සුරක්ෂිතතා ප්‍රමිතීන් 11 ක් ඇත.
- දරුවන්[1] සමග වැඩ කරන සංවිධාන ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය. අනුකූල වීම යන්නෙන් අදහස් කරන්නේ ඔබ[2] එක් එක් ප්‍රමිතිය අනුගමනය කරන බවත් ඒවා සපුරාලන බවත් පෙන්වීමට ඔබේ සංවිධානයට යම් යම් දේ තිබිය යුතු බවයි.


*මෙම ලේඛනය ළමා සුරක්ෂිතතා ප්‍රමිතීන්ගේ සාරාංශයකි. ප්‍රමිතීන් පැහැදිලි කිරීමට උපකාරී වන පහසුවෙන් තේරුම් ගත හැකි වචන සහ පින්තූර එහි ඇත. එයට ප්‍රමිතිවල සම්පූර්ණ වචන හෝ ඒවාට අනුකූල වීමට ඔබ කළ යුතු සියලු දේ ඇතුළත් නොවේ. අපගේ වෙබ් අඩවියෙන් ඔබට ප්‍රමිතිවල සම්පූර්ණ පාඨ සහ ඒවාට අනුකූල වන ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු කියවිය හැකි ය.*



1 "දරුවන්" යන්නෙන් අදහස් කරන්නේ අවුරුදු 18ට අඩු පුද්ගලයන් ය.

2 අපි "ඔබේ සංවිධානය" ගැන කතා කරන විට "ඔබ" යන වචනය ද භාවිත කරන්නෙමු.

## 1 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය







**ආදිවාසී දරුවන්ට සංස්කෘතික වශයෙන් සුරක්ෂිත බවක් දැනෙන බව සංවිධාන විසින් සහතික කරයි. ඔවුහු සෑම දරුවෙකුගේ ම අනන්‍යතාවයට සහ අත්දැකීම්වලට ගරු කරන අතර ඒවා අගය කරති.**

### ඔබේ සංවිධානය සහ කාර්ය මණ්ඩලය:

- ආදිවාසී[3] ජනතාව, ඔවුන්ගේ සංස්කෘතිය සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සාදරයෙන් පිළිගත යුතු ය.
- ආදිවාසී දරුවන්ට ආරක්ෂාකාරී බව දැනීමට සහ හොඳින් සිටීමට උපකාරී වන ආකාරය තේරුම් ගත යුතු ය.
- ජාතිවාදයට ඉඩ නොදිය යුතු අතර ජාතිවාදය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නීති රීති සහ ක්‍රියාමාර්ග තිබිය යුතු ය.
- ආදිවාසී දරුවන්ට ඔවුන්ගේ විවිධ අනන්‍යතා, සිරිත් විරිත්, විශ්වාසයන් සහ භාෂාවන් ප්‍රකාශ කිරීමට සහාය විය යුතු ය.
- ආදිවාසී දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ඔබේ සංවිධානයට සම්බන්ධ වීමට උදව් කළ යුතු ය.
- ඔවුන්ට සංස්කෘතික වශයෙන් සුරක්ෂිත බවක් දැනෙන බවට වග බලා ගත යුතු ය.
- ඔබ මේ දේවල් කර ඇති බව පෙන්වන ප්‍රතිපත්ති සහ පද්ධති තිබිය යුතු ය.

3 අපි ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් වැසියන් ගැන කතා කිරීමට ‘ආදිවාසී’ යන වචනය භාවිත කරන්නෙමු.

# 2 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය



දරුවන් සුරක්ෂිතව හා හොඳින් තබා ගැනීම කෙරෙහි සංවිධානයේ නායකයෝ අවධානය යොමු කරති. ළමා අපයෝජන හෝ හානි පිළිබඳ අවදානම් සොයා ගැනීමට, වළක්වා ගැනීමට සහ නැවැත්වීමට සංවිධාන සතුව ක්‍රියාවලීන් තිබේ.

ඔබේ සංවිධානය:

- ළමා ආරක්ෂාව සඳහා **මහජන කැපවීමක්** කළ යුතු ය. මෙයින් අදහස් කරන්නේ ඔබේ සංවිධානයට ළමා ආරක්ෂාව වැදගත් බව ඔබ ප්‍රජාවට දැනුම් දෙන බවයි.
- **ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තියක්** තිබිය යුතු ය. මෙය ඔබේ සංවිධානය දරුවන් ආරක්ෂා කර ගන්නා ආකාරය පැහැදිලි කරන ලේඛනයකි.
- සංවිධානයේ සිටින සෑම කෙනෙකු ම ළමා ආරක්ෂාව ප්‍රවර්ධනය කරන බවට වග බලා ගත යුතු ය.
- කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් සඳහා ලිඛිත **චර්යාධර්ම සංග්‍රහයක්** තිබිය යුතු ය. මෙය දරුවන් සමග කටයුතු කිරීමේ දී හැසිරිය යුතු ආකාරය සහ නුසුදුසු දේ කාර්ය මණ්ඩලයට පැහැදිලි කරන ලේඛනයකි.
- දරුවන්ට ඇති අවදානම් සොයා ගන්නේ කෙසේ ද, වළක්වා ගන්නේ කෙසේ ද සහ නවත්වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ලේඛනගත කළ යුතු ය.
- ළමා ආරක්ෂාව පිළිබඳ තොරතුරු බෙදා ගන්නේ කෙසේ ද සහ වාර්තා තබා ගන්නේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයට අවබෝධයක් ඇති බවට වග බලා ගත යුතු ය.

# 3 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය




දරුවන් තම අයිතිවාසිකම් ගැන දැන සිටින අතර ඒවා බැරෑරුම් ලෙස සලකමින්, තමන්ට බලපාන තීරණවලට සහභාගී වෙති.

ඔබේ සංවිධානය:

- පහත දැක්වෙන දරුවන්ගේ අයිතිවාසිකම් ගැන ඔවුන්ට පැවසිය යුතු ය:
  - ආරක්ෂාවට ඇති අයිතිය
  - තොරතුරුවලට ඇති අයිතිය
  - ඔවුන් පිළිබඳ තීරණවලට සහභාගී වීමට ඇති අයිතිය
- මිත්‍රත්වයේ වැදගත්කම තේරුම් ගෙන මිතුදම් ගොඩනගා ගැනීමට ළමුන්ව දිරිමත් කළ යුතු ය. මෙය දරුවන්ට ආරක්ෂාකාරී බවක් දැනීමට උපකාරී වේ.
- ලිංගික අපයෝජන වැළැක්වීම සඳහා වැඩසටහන් සහ තොරතුරු දරුවන්ට ලබා දිය යුතු ය.
- කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයන්ට පහත සඳහන් දේ කළ හැකි බවට වග බලා ගත යුතු ය:
  - දරුවන්ගේ ළමා අපයෝජනය සහ හානි පිළිබඳ ලක්ෂණ හඳුනා ගැනීමට
  - දරුවන්ට විවෘතව කතා කිරීමට සහ ඔවුන් කනස්සල්ලට පත් කරන දේවල් ගැන කතා කිරීමට උදව් කිරීමට
- ඔබේ සංවිධානයට සම්බන්ධ වී කටයුතු කිරීමට දරුවන්ට උදව් කළ යුතු ය.
- දරුවන් ඔබට පවසන දේ අනුව ක්‍රියා කළ යුතු ය, මන්දයත් එවිට ඔවුන්ට ආරක්ෂාකාරී බවක් දැනෙන අතර ඔවුන්ට ඔබේ සංවිධානය සමග සම්බන්ධව සිටීමට අවශ්‍ය වනු ඇත.

## 4 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය



**සංවිධාන, දරුවන් අපයෝජනයෙන් හා හානිවලින් ආරක්ෂා කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව පවුල්වලට සහ ප්‍රජාවන්ට දැනුම් දෙයි. දරුවන් අපයෝජනයෙන් හා හානිවලින් ආරක්ෂා කර ගැනීමට සම්බන්ධ වීමට ඔවුන් දිරිමත් කරයි.**

### ඔබේ සංවිධානය:

- තම දරුවාට බලපාන තීරණවලට සහභාගී වීමට පවුල්වලට උපකාර කළ යුතු ය.
- ඔබේ සංවිධානය දරුවන් අපයෝජනයෙන් හා හානිවලින් ආරක්ෂා කරන ආකාරය පිළිබඳව පවුල්වලට සහ ප්‍රජාවට පැවසිය යුතු ය.
- පවුල්වලට සහ ප්‍රජාවන්ට මෙම තොරතුරු පහසුවෙන් සොයා ගැනීමට සහ තේරුම් ගැනීමට හැකි බව සහතික කළ යුතු ය.
- ඔබේ සංවිධානයේ ප්‍රතිපත්ති සහ භාවිතයන් සඳහා පවුල්වලට සහ ප්‍රජාවන්ට අදහස් දැක්විය හැකි බව සහතික කළ යුතු ය.
- ඔබේ සංවිධානය සහ එය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව පවුල්වලට, රැකබලා ගන්නන්ට සහ ප්‍රජාවට පැවසිය යුතු ය.

## 5 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය



**සෑම දරුවෙකු ම වෙනස් බව සංවිධාන තේරුම් ගනී. ඔවුන්ට අවශ්‍ය රැකවරණය සහ සහයෝගය ලබා දීම සඳහා ඔවුන් සෑම දරුවකුගේ ම තනි අවශ්‍යතා සලකා බලයි.**

### ඔබේ සංවිධානය:

- සෑම දරුවකු ම වෙනස් බවත් සමහර දරුවන්ට වැඩි සහයෝගයක් අවශ්‍ය විය හැකි බවත් තේරුම් ගත යුතු ය.
- පහත සඳහන් දරුවන්ට උපකාර කළ යුතු අතර ඔවුන්ගේ අවශ්‍යතා සලකා බැලිය යුතු ය:
  - ආබාධිතත්වයක් සහිත
  - විවිධ සංස්කෘතීන්ගෙන් පැමිණෙන
  - විවිධ භාෂා කතා කරන
  - නිවසේ ජීවත් වීමට නොහැකි
  - ස්ත්‍රී සමලිංගික, සමලිංගික, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, නිර්-ද්විමය, ලිංගභේදය විවිධ, හෝ අන්තර්ලිංගික
- දරුවන්ට අවශ්‍ය තොරතුරු සහ උපකාර පහසුවෙන් ලබා ගත හැකි බව සහතික කළ යුතු ය මෙය සංස්කෘතික වශයෙන් ආරක්ෂිත සහ තේරුම් ගැනීමට පහසු විය යුතු ය.
- දරුවන්ට පැමිණිලි කිරීමට සහ ක්‍රියාවලිය තේරුම් ගැනීමට පහසු බව සහතික කළ යුතු ය.
- ආදිවාසී දරුවන්ගේ අවශ්‍යතා සලකා බැලිය යුතු අතර ඔවුන්ට සැමවිටම සංස්කෘතික වශයෙන් ආරක්ෂිත බවක් දැනෙන බවට වග බලා ගත යුතු ය.

# 6 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය



දරුවන් සමග වැඩ කරන පුද්ගලයන් ඒ සඳහා සුදුසු බවට සංවිධාන සහතික කරයි. කාර්ය මණ්ඩලයට සහාය ලැබෙන අතර, අපයෝජන හා හානිවලින් දරුවන් ආරක්ෂා කර ගැනීමට කළ යුතු දේ ඔවුන් දනී.

ඔබේ සංවිධානය:

- නව කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් බඳවා ගැනීමේ දී ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. මෙය ඔවුන් වැඩ ආරම්භ කිරීමට පෙර වෙළඳ දැන්වීම්, තීරක පරීක්ෂාවන් සහ පරීක්ෂා කිරීමේ දී සිදු විය හැකි ය.
- කාර්ය මණ්ඩලයේ සහ ස්වේච්ඡා සේවකයන්ගේ නිවැරදි පසුබිම් පරීක්ෂාවන් සිදු කර ඇති බවට වග බලා ගත යුතු ය.
- දරුවන්ව අපයෝජනයෙන් හා හානිවලින් ආරක්ෂා කර ගැනීම සඳහා කළ යුතු දේ නව කාර්ය මණ්ඩලය දන්නා බවට වග බලා ගත යුතු ය. මෙයට පහත සඳහන් දෑ ඇතුළත් වේ:
  - මනා වාර්තා තබා ගැනීම
  - තොරතුරු බෙදා ගත යුත්තේ කුමන අවස්ථාවේ දී දැයි දැන ගැනීම
  - වාර්තාවක් සකස් කරන්නේ කුමන අවස්ථාවේ දී ද යන්න සහ කෙසේ ද යන්න දැන ගැනීම
- ළමා ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කිරීමට කළමනාකරුවන් කාර්ය මණ්ඩලයට උදව් කරන බවට වග බලා ගත යුතු ය.

# 7 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය



පැමිණිලි සහ ගැටලු සඳහා වන ක්‍රියාවලීන් දරුවන් කේන්ද්‍ර කරගත් ඒවා වේ.

ඔබේ සංවිධානය:

- පැමිණිලි ප්‍රතිපත්තියක් තිබිය යුතු ය. මෙම ප්‍රතිපත්තිය:
  - සොයා ගැනීමට සහ කියවීමට පහසු විය යුතු ය
  - ළමා කේන්ද්‍රීය විය යුතු ය
  - පහත දැක්වෙන දේ පැහැදිලි කළ යුතු ය:
    - කළමනාකරුවන්, කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් කළ යුතු දේ කුමක් ද යන්න
    - විවිධ ආකාරයේ පැමිණිලි කළමනාකරණය කරන්නේ කෙසේ ද යන්න
    - ප්‍රතිපත්ති හෝ චර්යාධර්ම සංග්‍රහය අනුගමනය නොකරන්නේ නම් කුමක් කළ යුතු ද යන්න
    - ඔබේ සංවිධානයට පොලිසිය වැනි බලධාරීන්ට වාර්තාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන්නේ කොයි අවස්ථාවක ද යන්න
- ඔබේ සංවිධානය පැමිණිලි කළමනාකරණය කරන ආකාරය පිළිබඳව දරුවන්, පවුල්, කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් සියලු දෙනා අවබෝධ කරගෙන සිටින බවට වග බලා ගත යුතුය.
- පැමිණිලි නිසි ලෙස හා සංස්කෘතික වශයෙන් ආරක්ෂිත ආකාරයකින් හැසිරවිය යුතුය.
- සියලු පැමිණිලි සම්බන්ධයෙන් බැරෑරුම් ලෙස සලකමින් කඩිනමින් ප්‍රතිචාර දැක්විය යුතුය.
- පහත සඳහන් දේවල් පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි තිබිය යුතුය:
  - පැමිණිලි වාර්තා කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව
  - වාර්තා කරන්නේ කවුරුන් හට ද යන්න පිළිබඳව
  - වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේ කොයි අවස්ථාවක ද යන්න පිළිබඳව
  - පොලිසියට සහ අනෙකුත් බලධාරීන්ට පැමිණිලි වාර්තා කරන්නේ කෙසේ ද යන්න සහ ඔවුන් සමග කටයුතු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව
- වාර්තා කිරීම, පෞද්ගලිකත්වය සහ රැකියාව පිළිබඳ සියලු නීති අනුගමනය කළ යුතු ය.

# 8 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය



දරුවන් අපයෝජනයෙන් හා හානිවලින් ආරක්ෂා කර ගැනීම සඳහා සංවිධාන කාර්ය මණ්ඩලයට අධ්‍යාපනය සහ පුහුණුව ලබා දෙයි.

ඔබේ සංවිධානය:

- සංවිධානයේ ළමා ආරක්ෂක සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතු ය.
- ළමා අපයෝජනයේ සහ හානියේ ලක්ෂණ දැන සිටිය යුතු ය. මෙයට අනෙකුත් දරුවන් විසින් සිදු කරන අපයෝජන සහ හානි ඇතුළත් වේ.
- ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ගැටලුවලට ප්‍රතිචාර දැක්විය යුතු ය.
- ළමා ආරක්ෂණ ගැටලුවක් සම්බන්ධයෙන් කටයුතු කරන විට අනෙකුත් කාර්ය මණ්ඩලයට උදව් කළ යුතු ය.
- දරුවන්ට සංස්කෘතික වශයෙන් වඩාත් ආරක්ෂාකාරී බවක් දැනෙන්නට සලස්වන්නේ කෙසේදැයි අවබෝධ කර ගත යුතුය.

# 9 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය



සංවිධාන තම සේවාවන්, සැකසුම් සහ ක්‍රියාකාරකම් භාවිත කරන විට දරුවන් සුරක්ෂිත බව සහතික කරයි. දරුවන් මාර්ගගතව සම්බන්ධ වී සිටින විට ද මෙය අදාළ වේ.

ඔබේ සංවිධානය:

- කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයන්ට අවදානම් සොයාගෙන නැවැත්විය හැකි බවට වග බලා ගත යුතු ය. මෙය සිදු කරන විට ඔවුන් තව දුරටත් දරුවන්ට පහත සඳහන් දෑ සඳහා ඇති අයිතිය ආරක්ෂා කළ යුතු ය:
  - පෞද්ගලිකත්වයට
  - තොරතුරුවලට
  - මිතුදම් ඇති කර ගැනීමට සහ තනිකමක් නොදැනීමට
  - ඉගෙනීමට
- කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් මාර්ගගත ආරක්ෂාව තේරුම් ගෙන ඇති බවට වග බලා ගත යුතු ය. ඔවුන් මාර්ගගතව සම්බන්ධව සිටින විට, ඔවුන් ඔබේ සංවිධානයේ
  - චර්යාධර්ම සංග්‍රහයට
  - ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තියට අනුකූල විය යුතු ය.
- **අවදානම් කළමනාකරණ සැලසුම්** ලිවිය යුතු ය. ඔබේ සැකසුම්, ක්‍රියාකාරකම් සහ පරිසරයෙන් පැමිණිය හැකි අවදානම් සම්බන්ධයෙන් ඔබ කටයුතු කරන ආකාරය පිළිබඳ සැලසුම් මෙයින් අදහස් වේ.
- ඔබේ සංවිධානය වෙනත් සංවිධානවල පහසුකම් හෝ සේවාවන් භාවිත කරන විට දරුවන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කළ යුතුය.

# 10 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය



සංවිධාන විසින් දරුවන්ව අපයෝජනයෙන් හා හානිවලින් ආරක්ෂා කර ගන්නා ආකාර පරීක්ෂා කර වැඩිදියුණු කිරීම සිදු කරයි.

ඔබේ සංවිධානය:

- දරුවන් හා යොවුන් පුද්ගලයන් සුරක්ෂිතව තබා ගැනීමට ඔබ කුමක් කරන්නේ දැයි පරීක්ෂාකර බලමින් එය වැඩි දියුණු කළ යුතු ය.
- දරුවන් හා යොවුන් පුද්ගලයන් සුරක්ෂිතව තබා ගැනීම සඳහා ඔබ කරන දේ නිරන්තරයෙන් පරීක්ෂා කර වැඩිදියුණු කළ යුතු ය. මෙය ඔබ කරන දේ වැඩිදියුණු කිරීමට උපකාරී වේ.
- ඔබ සොයාගත් දේ පිළිබඳව කාර්ය මණ්ඩලයට, ස්වේච්ඡා සේවකයන්ට, ප්‍රජාවට, පවුල්වලට සහ දරුවන්ට පැවසිය යුතු ය.

# 11 වැනි ළමා සුරක්ෂිතතා ප්‍රමිතිය




අපයෝජනයෙන් හා හානිවලින් දරුවන් ආරක්ෂා කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව සංවිධානවලට ලිඛිත ලේඛන ඇත.

ඔබේ සංවිධානය:

- ලිඛිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි තිබිය යුතු ය:
  - ඒවා සියලු ම ළමා සුරක්ෂිතතා ප්‍රමිතීන් ආවරණය කළ යුතු ය
  - සොයා ගැනීමට සහ තේරුම් ගැනීමට පහසු විය යුතු ය
- ඔබේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සඳහා පාර්ශ්වකරුවන් සමග කටයුතු කළ යුතු ය. මොවුන් ඔබේ සංවිධානය ගැන උනන්දුවක් දක්වන පුද්ගලයන් ය. එනම්:
  - කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන්
  - දරුවන් සහ පවුලේ සාමාජිකයන්
  - ඔබ සමග වැඩ කරන අනෙකුත් සංවිධාන
  - ප්‍රජා කණ්ඩායම් හෝ සාමාජිකයන්
- වෙනත් සංවිධානවලින් ලැබෙන හොඳ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි විමසා බැලිය යුතු ය.
- ඔබේ නායකයන් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට සහාය දක්වන බවට වග බලා ගත යුතු ය.
- කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි තේරුම් ගෙන අනුගමනය කරන බවට වග බලා ගත යුතු ය.

# උදව් ලබා ගන්නේ කොතැනින් ද

ඔබට ප්‍රමිති සපුරාලීමට ළමා සුරක්ෂිතතා ප්‍රමිති නියාමකයන්ට තොරතුරු ලබා දිය හැකි ය.

ළමා සුරක්ෂිතතා ප්‍රමිති නියාමකයන් පිළිබඳව ඔබට මෙතැනින සොයා ගත හැකි ය.

ඔබට පහත සඳහන් ආකාරවලින් කොමිසම හා සම්බන්ධ විය හැකි ය:

- දුරකථනය: 1300 782 978
- Email: contact@ccyp.vic.gov.au
- වෙබ් අඩවිය: www.ccyp.vic.gov.au

Interpreter

ඔබට භාෂණ පරිවර්තකයකු අවශ්‍ය නම්, කරුණාකර 13 14 50 අංකයෙන් පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවාව අමතන්න. දරුවන් හා යොවුන පුද්ගලයන් වෙනුවෙන් වන කොමිසමට (Commission for Children and Young People) 1300 782 978 අංකයෙන් කතා කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.

කොමිසම විසින් වික්ටෝරියාව පුරා භූමියේ සාම්ප්‍රදායික භාරකරුවන් ගෞරවණීයව පිළිගනිමින ඔවුන්ව සමරන අතර ඔවුන්ගේ අතීත, වර්තමාන මෙන් ම අනාගත පරම්පරාවල වැඩිහිටියන් හා දරුවන් සහ යොවුන් පුද්ගලයන්ට සිය ගෞරවය පුදකර සිටියි.

© දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් වන කොමිසම 2023

මෙම කාර්යයට ප්‍රකාශන හිමිකම් සහිතයි. *1968 ප්‍රකාශන හිමිකම් පනත (Copyright Act)* යටතේ අවසර දී ඇති ඕනෑම භාවිතයක් හැර, දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් වන කොමිසමේ (Commission for Children and Young People) පූර්ව ලිඛිත අවසරයකින් තොරව කිසිදු කොටසක් කිසිදු ක්‍රියාවලියක් මගින ප්‍රතිනිෂ්පාදනය කළ නොහැක.

Level 18, 570 Bourke Street, Melbourne 3000.

2022 මැයි මාසයේ දී මෙම සම්පතේ (www.enliven.org.au /healthliteracy@enliven.org.au) සරල භාෂා අනුවාදය සංවර්ධනය කිරීමේ දී enliven's Health Literary Services දැක් වූ දායකත්වය කොමිසම අගය කර සලකයි.

රූප සංවර්ධනය කර අනුවර්තනය කරන ලද්දේ enliven Victoria විසිනි, පින්තූර සන්නිවේදන සංකේත භාවිතය ©1981-2022 Tobii Dynavox විසිනි. ලොව පුරා සියලු ම හිමිකම් ඇවිරිණි. අවසරය ඇතිව භාවිත වේ Boardmaker® යනු Tobii Dynavox හි වෙළඳ ලකුණකි. මෙම ලේඛනය තෙවන පාර්ශ්වයන්ට නොවිකිණිය යුතු ය. අවසරයකින් තොරව රූප නැවත භාවිත නොකළ යුතු ය.

COMMISSION FOR CHILDREN AND YOUNG PEOPLE